# ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය
## ආරක්ෂක අමාත්‍යාංශය

## ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පුරප්පාඩුව පවත්නා පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

### 01. අරක්කැමි (තනතුරු 4)

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් දෙකක් (02) සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්** : අරක්කැමි තනතුරට නියමිත කාර්මික නිපුණතාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) දෙවන හෝ තුන්වන මට්ටමට සරිලන සේ අත්පත් කරගෙන තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් දෙකක් (02) සමත් වී තිබීම.

**පළපුරුද්ද හා කාර්මික කුසලතාව** :

අරක්කැමි වෘත්තියෙහි වසර 05ක පළපුරුද්ද සහ වෘත්තීය පුහුණු ආයතනයකින් එකී තනතුරේ කාර්යභාරයට අදාළ වන වෘත්තීය පරීක්ෂණයක දී තහවුරු කෙරෙන NVQ 2 මට්ටමට නොඅඩු ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික (PL1) සේවා ගණයට අයත් සේවකයන්.

**වැටුප් ක්‍රමය** : PL 2-2025 (රු.42,300 - 10X490-10X540-10X590-12X630-රු.66,060)

### 02. භෝජනාගාර සේවක (තනතුරු 5)

**අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් දෙකක් (02) සමත් වී තිබීම.

**වැටුප් ක්‍රමය** : PL 1-2025 (රු.40,500-10X450-10X490-7X540-15X590-රු.62,530)

### 03. පරිගණක කාර්මික ශිල්පී (තනතුරු 1)

**බාහිර අයදුම්කරුවන්**

**වෘත්තීය සුදුසුකම්** : පරිගණක අලුත්වැඩියාවට /මෝටර් රථ අලුත්වැඩියාවට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**වෘත්තීය සුදුසුකම්** : අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (5)ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

**හෝ**

බාහිර අයදුම්කරුවන් සඳහා වන වෘත්තීය සුදුසුකම්.

**වැටුප් ක්‍රමය** : PL 3-2025 (රු.43,280-10×490-10×540-10×590-12×630 - රු.67,040)

### 04. මෝටර් රථ කාර්මික (තනතුරු 1)

**(පරිගණක කාර්මික ශිල්පී තනතුරෙහි දක්වා ඇති සුදුසුකම් සහ වැටුප් ක්‍රමය මෙම තනතුරටද අදාළ වේ.)**

### වෙනත්

1. බාහිර අයදුම්කරුවන් අවු. 18ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
2. ශ්‍රී ලාංකාවේ පුරවැසියෙකු විය යුතුය.
3. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
4. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**පත්වීමේ ස්වභාවය:**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**අයදුම්පත් එවිය යුතු ආකාරය:**

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ www.dscsc.lk වෙබ් අඩවියේ පළකර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පත් 2025.11.17 දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම් පත්‍රය සමග අයදුම්කරු සතු සියලුම අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික, සේවා සහතික, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පත ආදියෙහි පිටපත් තමා විසින්ම **සත්‍ය පිටපත්** බවට සහතික කොට එවීම **අනිවාර්යය වේ.** තැපැල්දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම විද්‍යාලය වගකියනු නොලැබේ.

දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වූවන් සිය අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය

**සේනාවිධායක,**
**ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය,**
**සපුගස්කන්ද, මාකොල.**
**0112964218**